# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 357/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 28/02/2024<br>පැය 1740 |

## මාධ්‍ය නිවේදනය

**ඇඟිලි සටහන් විද්‍යා විෂයට අදාළව පවත්වනු ලැබූ Advance Grade සහ Elementary විභාග සමත් නිලධරයින්ට හිමි සහතිකපත් පිරිනැමීම - අපරාධ වාර්තා කොට්ඨාසය.**

අපරාධ වාර්තා කොට්ඨාසයේ ඇඟිලි සටහන් විද්‍යා විෂයට අදාලව පවත්වනු ලැබූ Advance Grade සහ Elementary විභාගය සමත් නිලධරයන්ට සහතිකපත් පිරිනැමීම සහ පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ත්‍යාග ප්‍රධානය කිරීමේ උත්සවයක් 2024.02.28 වන අද දින පෙරවරු 0900 ට පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් අපරාධ වාර්තා කොට්ඨාසයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මෙහිදී ඇඟිලි සටහන් ඔස්සේ අපරාධ වලට සම්බන්ධ සැකකරුවන් හඳුනාගනිමින් අපරාධ විසඳීම සඳහා දක්වන ලද දායකත්වය වෙනුවෙන් අපරාධ වාර්තා කොට්ඨාසයේ නිලධරයන් සඳහා පොලිස් ත්‍යාග අරමුදලින් රුපියල් ලක්ෂ 94 කට ආසන්න මුදලක් පිරිනැමීම සංකේතාත්මකව නිලධාරීන් 19 දෙනෙකු සඳහා සිදුකරන ලදී.

මෙම අවස්ථාවට අපරාධ හා රථ වාහන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා, පුහුණුව සහ උසස් පුහුණු දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අසංක කරවිට මහතා, අපරාධ දිසාව භාර සහ පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දූව මහතා ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී විය.

ඡායාරූප


CRIMINAL RECORDS DIVISION
Sri Lanka Police
Certificate of Efficiency
This is to certify that






CRIMINAL RECORDS DIVISION
Sri Lanka Police
Certificate of Higher Efficiency
This is to certify that





මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.